NILIS

# මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Public Librarianship (පාඨමාලා කේතය: DPL)

DPL 2022/2023

### 1) හැඳින්වීම

වර්තමානයේ මහජන පුස්තකාලය ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වෙමින් තිබේ. විශේෂයෙන්ම මහජන පුස්තකාලයේ සමාජීය සහ සංස්කෘතික භූමිකාව පුළුල් වෙමින් පවතින අතර එය පොත් බැහැර දීම, විමර්ශනය, ව්‍යාපෘති සේවා යනාදී සාම්ප්‍රදායික සේවාවලින් ඔබ්බට ගමන් කරමින් තිබේ. එහෙයින් මහජන පුස්තකාලවල සේවය කරන මෙන්ම මහජන පුස්තකාලවල සේවයට සම්බන්ධ වීමට අපේක්ෂිත පුද්ගලයන් හට වඩාත් පුළුල් සමාජ හා සංස්කෘතික දැනුමක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත. මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාවෙන් අපේක්ෂා කරනුයේ මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ මෙකී නවමු පරිවර්තනයට උර දිය හැකි වෘත්තිකයන් පිරිසක් බිහි කිරීමයි.

### 2) ඉලක්ක කණ්ඩායම

මහජන පුස්තකාලවල සේවය කරන හෝ මහජන පුස්තකාල කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයකු සඳහා.

### 3) බඳවා ගැනීමේ සුදුසුකම්

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)

  **හෝ**

- අ.පො.ස (සා.පෙ.) සමත්වීම **සහ** ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන **මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL) / මහජන පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACPL) හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු

- මහජන පුස්තකාලයේ නවමු භූමිකාව අවබෝධ කර ගැනීමට,
- ප්‍රජා පාදක සංවර්ධනයේ දී මහජන පුස්තකාලයේ කාර්ය භාරය හඳුනා ගැනීමට,
- සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා මහජන පුස්තකාලයේ දායකත්වය වටහා ගැනීමට,
- නවීන තාක්ෂණය ප්‍රජා සංවර්ධනයේ දී යොදා ගත හැකි ආකාරය හඳුනා ගැනීමට හැකි වනු ඇත.

### 5) පාඨමාලාවට අන්තර්ගත විෂයයන්

1) ප්‍රජා සංවර්ධනය
2) එකතු කළමනාකරණය හා තොරතුරු සේවා
3) ස්වදේශික දැනුම ගවේශනය
4) සංස්කෘතික සාක්ෂරතාව
5) මාධ්‍ය සාක්ෂරතාව
6) මහජන පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය
7) ව්‍යාපෘතිය

**6) වැඩසටහනේ** වැදගත්කම: DPL පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




**7) පාඨමාලා කාලය :** මාස 12

**8) මාධ්‍ය:** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

**9) පන්ති පැවැත්වීම :** නැවත දැනුම් දෙනතුරු සියලුම පන්ති මාර්ගගතව (Online) පැවැත්වේ.

**10) ඇගයීම් ක්‍රමවේදය**

- සෑම විෂයක් සඳහාම පැවරුම් ලබා දෙන අතර ලිඛිත විභාගයක් ද පැවැත්වේ.එක් එක් විෂය සඳහා 50% ක් පැවරුම් වලින්ද ඉතිරි 50% ලිඛිත විභාගයෙන් ද ලකුණු එකතු කරනු ඇත. මෙයට අදාළව ව්‍යාපෘතියද සම්පූර්ණ කළ යුතුය.

**11) මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා සහතිකපත්‍රය ලබා ගැනීමට නම්**

- සියලුම විෂයන්ට අවම වශයෙන් C සාමාර්ථයක් ලබා ගත යුතුය. එනම් සෑම විෂයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය. විෂයන් තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට D හෝ E සාමාර්ථ තිබුණහොත් එම විෂයන් සඳහා පමණක් පුනර් පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

**12) පාඨමාලා ගාස්තු**

**සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 27900/= කි.** එම ගාස්තුව සම්පූර්ණයෙන් හෝ, මෙහි දැක්වෙන පරිදි වාරික දෙකකින් ගෙවිය හැකිය.

| වාරිකය | මුදල | ගෙවිය යුතු දිනය |
|---|---|---|
| **පළමු වාරිකය** | රු.16,150 | පාඨමාලාවට ලියාපදිංචි වීමට පෙර ගෙවිය යුතුය |
| **දෙවන වාරිකය** | රු.11,750 | පළමු සමාසික පරීක්ෂණයට පෙර ගෙවිය යුතුය(මාස 06ක් ඇතුළත). |

**13) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය : 2022 ජූලි 07**

**14) පාඨමාලා ආරම්භය: 2022 අගෝස්තු මස**

**15) අයදුම් කරන ආකාරය**

- අයදුම්පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් (https://nilis.cmb.ac.lk/home/news/2022/new_2022/2208/) බාගත කරන්න.
- අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න
- අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 250.00 ක මුදලක් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ 086100101191736 අංක දරණ ගිණුමට බැර කර මුල් ලදුපත අයදුම් පත්‍රයේ ලබා දී ඇති කොටුවේ අලවන්න.
- ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, අ.පො.ස./උ.පෙළ සහ අ.පො.ස./සා.පෙළ සහතික යන ලේඛනවල සහතික කළ පිටපත් අමුණන්න.
- ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පාඨමාලා කේතය ලියන්න.
- අයදුම්පත සහ අනෙකුත් ඇමුණුම් පහත ලිපිනයට තැපැල් කරන්න.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03.